**ජාතික සම්ප්‍රේෂණ ජාලය උදෙසා පුනර්ජනනීය බලශක්තිය අවශෝෂණ කර ගැනීමේ ව්‍යාපෘතිය - 2018**

---

ජාතික සම්ප්‍රේෂණ ජාලය උදෙසා පුනර්ජනනීය බලශක්තිය අවශෝෂණ කර ගැනීමේ ව්‍යාපෘතියේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා Agence Francaise De Development අතර 2015 ඔක්තෝබර් 02 දින එලඹි අංක සීඑල්කේ 101104 දරණ ණය ගිවිසුම සහ 2016 නොවැම්බර් 18 දින එලඹි අංක සීඑල්කේ 101104 එල් ණය ගිවිසුමේ 3.4.3 (ඌ) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලසීමාව

ව්‍යාපෘතියේ ණය ගිවිසුම් අනුව, විදුලිබල, බලශක්ති සහ ව්‍යාපාර සංවර්ධන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර ලංකා විදුලිබල මණ්ඩලය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. පුනර්ජනනීය බලශක්තිය ජාලක අවශෝෂණ ධාරිතාව ඉහල නැංවීම සහ සාමාන්‍ය නිෂ්පාදන පිරිවැය අඩු කිරීම මගින් ජාතික විදුලිබල පද්ධතියට පුනර්ජනනීය බලශක්තිය අවශෝෂණ කිරීම ව්‍යාපෘතියේ අරමුණ වේ. ව්‍යාපෘතියේ කටයුතු මාලිබොඩ, වේවැල්වත්ත, නාවලපිටිය, රාගල යන ප්‍රදේශවල 132/33 KV ක උප පොළවල් ඉදිකිරීම යන සංරචක 4 ක් යටතේ ක්‍රියාත්මක වේ. ණය ගිවිසුම් ප්‍රකාරව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු. මිලියන 6,660.10 කට සමාන යුරෝ මිලියන 41.10 වන අතර ඉන් රු. මිලියන 4,865.90 කට සමාන යුරෝ මිලියන 30 ක් මූල්‍යයනය කිරීමට Agence Francaise De Development එකඟ වී තිබුණි. ඉතිරි මුදල වන රු.මිලියන 1,794.20 ක් මූල්‍යනය කිරීමට ශ්‍රී ලංකා රජය අපේක්ෂා කෙරේ. ව්‍යාපෘතියේ කටයුතු 2016 අප්‍රේල් 01 දින ආරම්භ කරන ලද අතර 2019 ඔක්තෝබර් 30 දින වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි.

## 1.3 තත්ත්වාගණනය කළ මතය

මාගේ වාර්තාවේ 02 වගුවෙන් විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, ව්‍යාපෘතියේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ක්‍රියාකාරිත්වය හා එහි මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ව්‍යාපෘතිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ව්‍යාපෘතිය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ

නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ව්‍යාපෘතියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

ව්‍යාපෘතිය වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශ පිළිබඳ අදහස් දැක්වීම

### 2.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| අංකය | ගිණුම්කරණ අඩුපාඩුව | මුදල රු.මිලියන | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | 2018 දෙසැම්බර් 31 දිනට විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ දැක්වෙන මුදල් කරන ලද රු. මිලියන 1,252.91 ක ණය මුදල ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන මුදල් කරන ලද රු.මිලියන 907.47 ක මුදල සමඟ එකඟ නොවේ. | 345.44 | කෙරීගෙන යන වැඩ අඩුවෙන් දැක්වීම. | ලංකා විදුලි බල මණ්ඩලය 2018 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ඔවුන් විසින් සිදුකරන ගෙවීම් සඳහා ණය නියෝජිතායතනයෙන් ලැබෙන සනාථන සැලකිල්ලට ගෙන ඇත. | ණය නියෝජිතායතනය විසින් සනාථ කරන ලද එකතුව රු.මිලියන 345.44 සැලකිල්ලට ගැනීමට අවශ්‍ය වේ. |
| (ආ) | වැරදි ගිණුම්කරණ සටහනක් හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු.මිලියන 893.16 ක ලංකා විදුලි බල මණ්ඩලයේ දායකත්වය රු.මිලියන 3.63 කින් වැඩියෙන් දක්වා තිබුණි. | 3.63 | වැඩියෙන් දැක්වීම. | පොදුවේ පිළිගත් මූලධර්ම වලට අනුව, ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා උපචිත පදනම අනුගමනය කර තිබුණි. | ගිණුම්කරණ වරද නිවැරදි කිරීම අවශ්‍ය වේ. |

### 2.2 නීති, රීති සහ රෙගුලාසි වලට අනුකූල නොවීම

| නීති, රීති සහ රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ 2007 අගෝස්තු 07 දිනැති අංක එම්ඕඑෆ්පී/ඊආර්ඩී/2007/02 දරන චක්‍රලේඛය | 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 31 දිනට හෝ ඊට පෙර විගණනය සඳහා ඉදිරිපත් කළ යුතු වුවත්, 2019 අප්‍රේල් 10 දින ඉදිරිපත් කර තිබුණි. | චක්‍රලේඛ උපදෙස් වල දක්වා ඇති ප්‍රධාන අවශ්‍යතාවයන් අනුගමනය කර නොමැත. | අදහස් දක්වා නොමැත. | විගණනය සඳහා නියමිත දිනයට මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කළ යුතුය. |

## 3. භෞතික ප්‍රගතිය

### 3.1 ව්‍යාපෘතියේ කටයුතු වල භෞතික ප්‍රගතිය

ව්‍යාපෘතියේ ක්‍රියාකාරී සැලසුමට අනුව, ව්‍යාපෘති කාලපරිච්ඡේදය තුළදී සබරගමුව පළාතේ මාලිබොඩ සහ වේවැල්වත්ත සහ මධ්‍යම පළාතේ නාවලපිටිය සහ රාගල විදුලි උපපොළවල් ඉදිකිරීමට අපේක්ෂා කර තිබුණි. ව්‍යාපෘතියේ ප්‍රගති වාර්තා අනුව, විදුලි උපපොළවල ඉදිකිරීම් සහ සම්ප්‍රේෂණ මාර්ගවල

ඉදිකිරීම් කටයුතුවල සමස්ත ප්‍රගතිය 2018 දෙසැම්බර් 31 දිනට අපේක්ෂිත ඉලක්කය වූ සියයට 42 ට පිටුපසින් සියයට 37.5 ක්ව පැවතුණි. කෙසේවෙතත් ඒ සඳහා පිරිනමන ලද කොන්ත්‍රාත් 15 න් අමු ද්‍රව්‍ය සහ භාණ්ඩ සැපයීමේ කොන්ත්‍රාත් 03 ක් 2018 දෙසැම්බර් 31 දිනට අවසන් කර තිබුණි.

## 3.2 පද්ධති හා පාලනයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන ගැටළුව | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1978 දෙසැම්බර් 31 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛයේ අවශ්‍යතා අනුව, ව්‍යාපෘති මෙහෙයුම් ඒකකය විසින් ව්‍යාපෘතියේ ස්ථාවර වත්කම් ලේඛනයක් නිසි පරිදි නඩත්තු කර නොතිබුණි. | වත්කම්වල පැවැත්ම සත්‍යාපනය කිරීමට නොහැකි විය. | විගණන අරමුණු සඳහා ස්ථාවර වත්කම් ලේඛනයක් ඇති අතර සියළුම පිරිවැය මධ්‍යස්ථාන වල ස්ථාවර වත්කම්වල විස්තර ඇත. | ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනව පවත්වා ගත යුතුය. |
| (ආ) | මුදල් රෙගුලාසි 134(3) සහ 2010 ජුලි 26 දිනැති අංක 05 දරන කළමනාකරණ විගණන චක්‍රලේඛයට අනුව, ලංකා විදුලි බල මණ්ඩලයේ අභ්‍යන්තර විගණන අංශය මඟින් ව්‍යාපෘතියේ ගනුදෙනු විගණනය කර නොතිබුණි. | අභ්‍යන්තර පාලනයක් නිසි පරිදි ක්‍රියාත්මක නොවිය හැක. | අදහස් දක්වා නොමැත. | අභ්‍යන්තර විගණන අංශය මඟින් ව්‍යාපෘතියේ ගනුදෙනු විගණනය කළ යුතුය. |